සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

නර්තනය (දේශීය) I
நடனம் (தேசிய) I
Dancing (Indigenous) I

52 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..........................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 04 | |
| 02 | 05 - 13 | |
| 03 | 14 - 23 | |
| 04 | 24 - 35 | |
| 05 | 36 - 44 | |
| 06 | 45 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති/ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

*උපදෙස්:*

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

- අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** ඔබ උගත් සම්ප්‍රදායට අනුව තෙයිකිට තෙයි තාම්/ තෙයි කිට තෙයි තා/ තෙයි තක යන පා සරඹය හෝ මණ්ඩි පදය හෝ අයත් වන්නේ,
(1) දෙවන පා සරඹයට/මණ්ඩි පදයට ය. (2) තෙවන පා සරඹයට/මණ්ඩි පදයට ය.
(3) පස්වන පා සරඹයට/මණ්ඩි පදයට ය. (4) සයවන පා සරඹයට/මණ්ඩි පදයට ය.
(5) එකොළොස්වන පා සරඹයට/මණ්ඩි පදයට ය. (.........)

**2.** දේශීය නර්තනයට අදාළ පැනීම් සහ කැරකීම් පුහුණු කිරීම මගින්
(1) භාව ප්‍රකාශනය, රස ජනනය සහ නිවැරදි අංගහාර සංවර්ධනය කරයි.
(2) මණ්ඩිය, අංගහාර සහ භාව ප්‍රකාශනය වර්ධනය කරයි.
(3) සමබරතාව, පාද හැසිරවීම සහ අවකාශ භාවිතය හුරු කරයි.
(4) ශරීර නම්‍යතාව, මණ්ඩිය සහ තාල අවබෝධය වැඩි දියුණු කරයි.
(5) මණ්ඩිය, තාල අවබෝධය සහ භාව ප්‍රකාශනය හුරු කරයි. (.........)

**3.** ගජගා වන්නම/ සෙබළුවෙච්චි තාලය/ අටකුරු ගාහක වන්නම නර්තනය කරනු ලබන්නේ,
(1) සුළු තනිතිතට ය. (2) මැදුම් තනිතිතට ය.
(3) මහ තනිතිතට ය. (4) මැදුම් මහ දෙතිතට ය.
(5) සුළු මහ දෙතිතට ය. (.........)

**4.** තම්මැට්ටම සහ උඩැක්කිය සඳහා භාවිත කළ හැකි අවශේෂ නාම පිළිවෙළින් සඳහන් වරණය තෝරන්න.
(1) කුණ්ඩලම්පල්ල සහ ඩැක්කිය (2) දැත හරි බෙරය සහ තියඳ කෙඳි බෙරය
(3) දෙබෑ බෙරය සහ සිරිවසය (4) පොකුරු බෙරය සහ කිඳුරු බෙරය
(5) පොකුරු බෙරය සහ සිරිවසය (.........)

[දෙවැනි පිටුව බලන්න.

CamScanner

5. රස සිද්ධාන්තය පිළිබඳව සාහිත්‍ය විවරණයක් ඉදිරිපත් කරන ලද පෙරදිග පඬිවරුන් වන්නේ,
   (1) භරතමුනි, නන්දිකේශ්වර සහ වල්ලතෝල් නාරායන් ය.
   (2) භරතමුනි, නන්දිකේශ්වර සහ ඇරිස්ටෝටල් ය.
   (3) ආනන්දවර්ධන, අභිනවගුප්ත සහ නන්දිකේශ්වර ය.
   (4) ආනන්දවර්ධන, නන්දිකේශ්වර සහ ඇරිස්ටෝටල් ය.
   (5) ප්ලේටෝ, සොක්‍රටීස් සහ අභිනවගුප්ත ය. (.........)

6. "රුපයක් ඇති මුහුණු සයකින් අත් දොළසකින් බබුළුවාගෙන" මෙම කවිය,
   (1) නමස්කාරයකි. (2) සුවිසි විවරණ කවියකි.
   (3) තළවනේ කවියකි. (4) වරම් කවියකි.
   (5) සිරසපාද කවියකි. (.........)

7. කෝට්ටේ යුගයේ පිරිවෙන් අධ්‍යාපනයට නාට්‍ය කලාව ඇතුළත් වූ බවට තොරතුරු ලබා ගත හැක්කේ,
   (1) සුනේත්‍රාදේවි පිරිවෙන සහ විද්‍යාලංකාර පිරිවෙන ඇසුරෙනි.
   (2) තොටගමුවේ විජයබා පිරිවෙන සහ කැරගල පද්මාවතී පිරිවෙන ඇසුරෙනි.
   (3) තොටගමුවේ විජයබා පිරිවෙන සහ විද්‍යාලංකාර පිරිවෙන ඇසුරෙනි.
   (4) විද්‍යෝදය පිරිවෙන සහ කැරගල පද්මාවතී පිරිවෙන ඇසුරෙනි.
   (5) විද්‍යෝදය පිරිවෙන සහ තොටගමුවේ විජයබා පිරිවෙන ඇසුරෙනි. (.........)

8. ප්‍රශස්ති කාව්‍ය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) මහනුවර යුගයේ ලියැවුණු පැරකුම්බා සිරිත මුල් ම ප්‍රශස්ති කාව්‍යයයි.
   (2) වන්දිභට්ටයින් විසින් ගායනය කළ අතර දෙවියන් පමණක් වර්ණනා කෙරේ.
   (3) කෝට්ටේ යුගයේ බිහි වී මහනුවර යුගයේ දී දියුණු විය.
   (4) අතිශයෝක්ති වර්ණනා බහුල අතර යුධ අවස්ථාවන්හි දී භාවිත කෙරිණි.
   (5) කෝට්ටේ යුගයේ බිහි වූ අතිශයෝක්ති වර්ණනාවලින් තොර ගායන විශේෂයකි. (.........)

9. "නිරිතකොණ යුතා මල් මල් සුවඳැති ..." මෙම කවියෙන් කියැවෙන්නේ කුමන ග්‍රහයා පිළිබඳව ද?
   (1) ශනි ග්‍රහයා (2) කෙහෙතු ග්‍රහයා
   (3) සිකුරු ග්‍රහයා (4) බුද ග්‍රහයා
   (5) රාහු ග්‍රහයා (.........)

10. සුහත බලිය සහ කඨිනා බලිය යන බලි යොදාගනු ලබන්නේ,
   (1) ගැබිනි මව්වරුන් සඳහා ය. (2) වර්ෂාව ලබා ගැනීම සඳහා ය.
   (3) නවග්‍රහ අපල දුරු කර ගැනීමට ය. (4) උපසම්පදා පිංකම් අවසානයේ දී ය.
   (5) කඨින උත්සව අවසානයේ දී ය. (.........)

11. වලියක් මංගල්‍යයේ පුරාවෘත්තය හා බැඳි චරිත වන්නේ,
   (1) විෂ්ණු දෙවියන්, සීතා බිසව සහ කුවේණිය ය.
   (2) මල රජතුන්කට්ටුව, කුවේණිය සහ රාම කුමරු ය.
   (3) මල රජතුන්කට්ටුව, සීතා බිසව සහ විජය කුමරු ය.
   (4) විජය කුමරු, පත්තිනි දේවිය සහ පාලඟ කුමරු ය.
   (5) මල රජතුන්කට්ටුව, පත්තිනි දේවිය සහ පාලඟ කුමරු ය. (.........)

12. රන් පැහැය සහ නිල් පැහැය හිමි ග්‍රහයින් පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?
   (1) ගුරු සහ කේතු (2) අඟහරු සහ ගුරු
   (3) සෙනසුරු සහ කේතු (4) ගුරු සහ සෙනසුරු
   (5) කේතු සහ ඉරු (.........)

13. මාත්‍රා පහක තාල ලක්ෂණය පෙන්නුම් කරන දේශීය, කර්ණාටක සහ හින්දුස්ථානි තාලරූප පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
   (1) පංචතාලය, බණ්ඩජාති ඒකතාලය සහ ජප් තාලය
   (2) සුළු මැදුම් දෙතිත, ජප් තාලය සහ බණ්ඩජාති ඒකතාලය
   (3) සුළු මැදුම් දෙතිත, බණ්ඩජාති ඒකතාලය සහ ජප් තාලය
   (4) සුළු මැදුම් දෙතිත, මිශ්‍රජාති ඒකතාලය සහ දීප්චන්දි තාලය
   (5) පංච තාලය, මිශ්‍ර චාපු තාලය සහ ජප් තාලය (.........)

[තුන්වැනි පිටුව බලන්න.

CamScanner

**14.** කෙසෙල් බඩය උපයෝගී කරගනිමින් තනි තට්ටුවකින් හෝ තට්ටු කිහිපයකින් හෝ යුක්තව නිම කෙරෙන ශාන්තිකර්ම සැරසිල්ල කුමක් ද?
(1) ගොක් ගෙඩිය (2) මල් යහන (3) ජේකඩ
(4) මල් බලිය (5) මල් බුලත්තටුව (.........)

**15.** තාල ඥානය සහ සිංහල නර්තන කලාව යන කෘති රචනා කරන ලද්දේ පිළිවෙලින්,
(1) වින්සන්ට් සෝමපාල සහ මුදියන්සේ දිසානායක ය.
(2) සරත් විජේවර්ධන සහ මුදියන්සේ දිසානායක ය.
(3) ජේ. ඊ. සේදරමන් සහ වින්සන්ට් සෝමපාල ය.
(4) වින්සන්ට් සෝමපාල සහ ජේ. ඊ. සේදරමන් ය.
(5) මුදියන්සේ දිසානායක සහ තිස්ස කාරියවසම් ය. (.........)

**16.** කුලීනයන් අතර පැවති බටහිර බැලේ රංග කලාව පොදු ජනයා අතර ව්‍යාප්ත කිරීමට මුල් වූයේ
(1) ජීන් බැප්ටිස් ලිලි ය. (2) ඇනා පව්ලෝවා ය.
(3) ජීන් ජෝර්ජ් නොවැර් ය. (4) 14 වන ලුවී රජු ය.
(5) කැතරින් ඩි. මෙඩිසි ය. (.........)

**17.** ගම්පොළ යුගයේ දී ලියැවුණු මයුර සංදේශයේ දෙවුන්දර උපුල්වන් දේවාලයෙහි පැවති නර්තන පිළිබඳ දැක්වෙන කවි පදය කුමක් ද?
(1) රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා
(2) විදෙන ලෙළෙන නරු බර පුළුලුකුල රැදී
(3) රළලා උපුලා ලෙලුම තුලායා
(4) ලෙළවන දිගු නෙත තිලුපුල සේයා
(5) අඳිමින් සුදු පට සළු ගෙළ සඳුනෙන් තුනු තවරා (.........)

**18.** වන්නම් සාහිත්‍යය පිළිබඳ විමසීමේ දී විදග්ධ කාව්‍ය ලක්ෂණ සහිතව රචනා වී ඇතැයි සැලකෙන්නේ,
(1) උඩරට වන්නම් ය. (2) පහතරට සින්දු වන්නම් ය.
(3) සබරගමු වන්නම් ය. (4) අද්‍යතන වන්නම් ය.
(5) අප්‍රචලිත වන්නම් ය. (.........)

**19.** ආලෝකකරණයේදී විශ්මය සහ අද්භූත බව මතු කිරීම සඳහා වඩාත් සුදුසු පහන් (lamp) වර්ගය වන්නේ මින් කුමක් ද?
(1) ඩිමර් (Dimmer)
(2) ස්පොට් ලයිට් (Spot Light)
(3) ෆලෝව් ස්පොට් ලයිට් (Follow Spot Light)
(4) ෆ්ලඩ් ලයිට් (Flood Light)
(5) අල්ට්‍රා වයලට් ලැම්ප් (Ultra Violet Lamp) (.........)

**20.** තිහ දශකයේ දී විධිමත් නර්තන අධ්‍යාපනයට ප්‍රවේශයක් ලබා දුන් ආයතනයක් සහ අධ්‍යාපනඥයෙක් වන්නේ,
(1) හොරණ ශ්‍රීපාලිය සහ එස්. එල්. බී. කපුකොටුව ය.
(2) හොරණ ශ්‍රීපාලිය සහ ජේ. ඩී. ඒ. පෙරේරා ය.
(3) හේවුඩ් ආයතනය සහ විල්මට් ඒ. පෙරේරා ය.
(4) ගාන්ධර්ව සභාව සහ ජේ. ඩී. ඒ. පෙරේරා ය.
(5) හේවුඩ් ආයතනය සහ එස්. පණිභාරත ය. (.........)

**21.** සන්නි යකාගේ උත්පත්තිය කුමන රාජ පරම්පරාවක් හා සම්බන්ධවේ ද?
(1) මහා සම්මත රාජ පරම්පරාව (2) කාලාශෝක රාජ පරම්පරාව
(3) ආර්ය වංශය (4) ලිච්ඡවී රාජ පරම්පරාව
(5) ශාක්‍ය වංශය (.........)

**22.** ශාන්තිකර්මයක, එක් නාට්‍යමය පෙළපාළියක් තුළ කාන්තා චරිත තුනක් නිරූපණය කෙරෙනුයේ,
(1) සූනියම් ශාන්තිකර්මයේ දී ය. (2) සන්නි යකුමේ දී ය.
(3) මහ සොහොන් සමයමේ දී ය. (4) කඩවර කංකාරියේ දී ය.
(5) කපුයක්කාරියේ දී ය. (.........)

**23.** නෘත්ත ගණයට ගැනෙන 'අලාරිප්පු' අයත් නර්තන සම්ප්‍රදාය කුමක් ද?
(1) මනිපුරි (2) කථකලි
(3) මෝහිණි ආට්ටම් (4) කථක්
(5) භරත නාට්‍යම් (.........)



CamScanner

24. "මැටිසිල්" මුද්‍රා නාට්‍යයේ කාන්තා චරිත නිරූපණය කිරීම සඳහා කෝලම් නාට්‍යය ඇසුරෙන් යොදා ගන්නා ලද බෙර පදය වන්නේ,
(1) දිත් තම් දිතකු දොම් දොම් තාම් ය.
(2) ගුං දැහිං ගුද ගුද දැහිං ය.
(3) දොංත ගතං දොංත ගතිගතං ය.
(4) දොම් ගතිකිට දොම් දිම් ගතිකිට ය.
(5) ගත ගුම් ටිම්ගත ගදිගත ගදිත ගතම් ය.
(.........)

25. පහත A, B සහ C රූප සටහන් මගින් දැක්වෙන චරිත අනුපිළිවෙළින් සඳහන් කර ඇති වරණය කුමක් ද?


A


B


C

(1) පොලිස්, වෙදරාළ, සොකරි
(2) හෙන්වා, වෙදරාළ, නොන්චි
(3) ජස, ආරච්චි, කලස්පාලිය
(4) පොලිස්, ජස, නොන්චි
(5) පොලිස්, හෙන්වා, නොන්චි
(.........)

- අංක 26 සිට 35 තෙක් දී ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට වඩාත් සුදුසු වචන/වචනය යොදන්න.

26. රිද්දි යාගයේ දී අවශ්‍යතාව මත අඹන්නා වූ ............................ බලිය සුවිශේෂ සැරසිල්ලකි.

27. ශ්‍රී ලංකාවේ සංගීත භාණ්ඩ පිළිබඳ ප්‍රථම වර්ගීකරණය හමුවන්නේ මහාවංශයට ලියන ලද ටීකාවක් වූ ............................ මූලාශ්‍රයෙනි.

28. අටමඟල වෙනුවට වලියක් මංගල්‍යයේ දී අඳිනු ලබන සැරසිල්ල ................................ යන පාරිභාෂික නාමයෙන් හඳුන්වනු ලැබේ.

29. කෘෂිකාර්මික ජන ජීවිතයෙහි ගවයාට ඇති වැදගත්කම ................................ ශාන්තිකර්මයේ අරමුණු විමසීමේ දී පැහැදිලි වේ.

30. නිශ්චිත තාල රූපයක වේගය .................... මානය ලෙස සම්ප්‍රදායේ භාවිත වේ.

31. ගැටබෙර වාදනය කිරීමේ ශිල්ප ක්‍රමයක් වන දඹිදොඹිය, ............................ යන නමින් ද හැඳින්වේ.

32. සත්පත්තිනි, දිට්ඨමංගලිකා සහ කෝච්චිය යන මුද්‍රා නාට්‍ය ................................ විසින් නිර්මාණය කර තිබේ.

33. මගේ කාරිය මම පැළපොල් සිටුවනවා
උගේ කාරිය ඌ පැළපොල් වනසනවා

මෙම කවිය ................................ නාට්‍යමය පෙළපාළියට අයත් වේ.

34. "නෙර්තමාලය" දකුණු ඉන්දියාවේ සිට මෙහි පැමිණි ................................ විසින් ලියන ලද්දකැයි වන්නම් ඉතිහාසයෙහි සඳහන් වේ.

35. නර්තනයේ දී ශරීරය කේන්ද්‍ර කොටගත් සම්පූර්ණ දිශා ගණන .................... කි.

[පස්වැනි පිටුව බලන්න.

CamScanner

- අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.

**36.** දේශීය තාල පද්ධතිය පිළිබඳ 1962 දී පළ වූ කෘතිය සහ එහි රචකයා නම් කරන්න.

(i) කෘතිය : ..........................................

(ii) රචකයා : ..........................................

**37.** කොහොඹා යක්කංකාරියේ දී ඉදිරිපත් කෙරෙන යක්තම් **දෙකක්** නම් කරන්න.

(i) ............................................................

(ii) ............................................................

**38.** දෙවොල් දෙවියන් ලක්දිවට පැමිණි නැවේ කුඹ ගස නිරූපණය කිරීම සඳහා ඉදිකෙරෙන සැරසිල්ල සහ භාවිත ශාන්තිකර්මයක් නම් කරන්න.

(i) සැරසිල්ල : ..........................................

(ii) ශාන්තිකර්මය : ..........................................

**39.** වෙස් ඇඳුම් කට්ටලයෙහි අඳින රෙද්ද සහ පච්චවඩම හැඳින්වීම සඳහා භාවිත පාරිභාෂික වචන මොනවා ද?

(i) අඳින රෙද්ද : ..........................................

(ii) පච්ච වඩම : ..........................................

**40.** කළුයකා සහ නානුමුරය යන පෙළපාළි අංග ඇතුළත් ශාන්තිකර්ම කවරේ ද?

(i) කළුයකා : ..........................................

(ii) නානුමුරය : ..........................................

**41.** භරත නාට්‍ය සම්ප්‍රදායේ භාවිත ආභරණ අතර අට්ටියල් සහ සලංගෙයි පළඳිනු ලබන්නේ ශරීරයේ කිනම් ස්ථාන සඳහා ද?

(i) අට්ටියල් : ..........................................

(ii) සලංගෙයි : ..........................................

**42.** දේශීය තාල පද්ධතියේ මැදුම් තනිතිත සහ මැදුම් මහ දෙතිතට සමාන හින්දුස්ථානි තාල රූපය බැගින් නම් කරන්න.

(i) මැදුම් තනිතිත : ..........................................

(ii) මැදුම් මහ දෙතිත : ..........................................

**43.** නෘත්ත, නෘත්‍ය සහ නාට්‍ය වර්ගීකරණයට අනුව ඨුම්රි සහ තරානා නර්තනාංග අයත් වන්නේ කවර ප්‍රවර්ගයට ද?

(i) ඨුම්රි : ..........................................

(ii) තරානා : ..........................................

**44.** පේමතෝ ජායති සෝකෝ සහ දෙපානෝ ගීත නාටක නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(i) පේමතෝ ජායති සෝකෝ : ........................................................

(ii) දෙපානෝ : ........................................................



CamScanner

**45.** ද්‍රවිඩ ජන නැටුම් ලෙස සැලකෙන පින්නල් කෝලාට්ටම් සහ අරවිවෙට්ටු නර්තන අංගයන්ට සමාන සිංහල ජන නැටුම් සඳහන් කරන්න.

(i) පින්නල් කෝලාට්ටම් : ..........................................

(ii) අරවිවෙට්ටු : ..........................................

**46.** ඊ පැදියක අවසානයේ ඇදෙන මාත්‍රා හඳුන්වන නාමය සහ ඊට අදාළ සංකේතය නම් කරන්න.

(i) ඇදෙන මාත්‍රා නාමය : ..........................................

(ii) සංකේතය : ..........................................

**47.** පහත දැක්වෙන රූපයන්හි භාව නම් කරන්න.



**A**



**B**

(i) **A** භාවය : ..........................................

(ii) **B** භාවය : ..........................................

**48.** හෙන්වා (හෙංචප්පු) නම් සේවකයා සමග සභාවට පිවිසෙන කෝලම් චරිතය සහ එමගින් උපදින රසය නම් කරන්න.

(i) චරිතය : ..........................................

(ii) රසය : ..........................................

**49.** "ඉණේ හවඩි රන් කෙඳිවත්" මෙම කවි පාදය සුළු මහ දෙතිත $(2+4)$ තාලයට අනුව ගායනය කිරීමේ දී අයත්වන සදැස් මත් සහ ගී මත් සංඛ්‍යාව ලියා දක්වන්න.

(i) සදැස් මත් : ..........................................

(ii) ගී මත් : ..........................................

**50.** හිං හතරේ සහ මඩු පුරයේ කවි ගායනා කෙරෙන ශාන්තිකර්ම නම් කරන්න.

(i) හිං හතරේ කවි : ..........................................

(ii) මඩු පුරයේ කවි : ..........................................

* * *

12635



[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය I, II හා III වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* I කොටසේ 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.
* II හා III කොටස්වලින් **අවම වශයෙන් එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම (i) කොටසට ලකුණු 06ක් ද (ii) කොටසට ලකුණු 06ක් ද (iii) කොටසට ලකුණු 08ක් ද වශයෙන් මුළු ලකුණු 20ක් බැගින් හිමි වේ.

## I කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරාගෙන සමගුණ සහ දෙගුණට ප්‍රස්තාර කරන්න.
   (අ) දොම්කිට කිට දොම් (ආ) රෙගුද ගතකු දොම් (ඉ) කිටිතක දොම්කිට
   (ii) පහත සඳහන් කවි පාදය අවග්‍රහයෙන් ආරම්භ කර මැදුම් තනිතිතට ප්‍රස්තාර කරන්න.
   "ධීර ගුණැති දීපංකර මුනි බුදු වෙමිනේ..."
   (iii) සුරපති වන්නමේ කස්තිරම හෝ ග්‍රහදණ්ඩ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ මෙස වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

2. ශ්‍රී ලාංකේය නර්තන කලාව උදෙසා රාජ්‍ය අනුග්‍රහය ලැබී ඇති බව පුරාවිද්‍යා හා සාහිත්‍ය මූලාශ්‍රය මගින් හෙළි වේ.
   (i) දුටුගැමුණු රජතුමා ආගමික කටයුතු සඳහා නර්තනය සහ වාදනය සම්බන්ධ කරගත් බවට මහාවංශය සහ ථූපවංශය ඇසුරින් **එක්** සාධකය බැගින් ගෙන පැහැදිලි කරන්න.
   (ii) මහා පරාක්‍රමබාහු රජතුමා නාට්‍ය, ගීත ආදී විනෝදාංග සඳහා ද අනුග්‍රහය දක්වා ඇති බව මූලාශ්‍රය **දෙකක්** ඇසුරින් විස්තර කරන්න.
   (iii) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේ දී නර්තන කලාවට ද හිමිවූයේ ප්‍රමුඛස්ථානයකි. සාධක **හතරක්** ඇසුරින් සාකච්ඡා කරන්න.

## II කොටස

3. දේශීය ශාන්තිකර්ම මගින් සමාජ සහජීවනය සඳහා මෙන්ම මනෝ චිකිත්සනය සඳහා ද උපදේශන සපයයි.
   (i) බලි ශාන්තිකර්ම හා බැඳුණු සමාජ විශ්වාස **දෙකක්** පැහැදිලි කරන්න.
   (ii) ඌරා යක්කමෙන් සමාජ සහජීවනය සඳහා ලබාදෙන උපදේශන **දෙකක්** විමසුමට ලක් කරන්න.
   (iii) සන්නියකුම ශාන්තිකර්මයෙන් මනෝ චිකිත්සනය සිදුවන අයුරු සන්නි චරිතයක් සහ යක්ෂ චරිතයක් ඇසුරින් විග්‍රහ කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

4. දේශීය ශාන්තිකර්ම විවිධ අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා ගොඩනැගී ඇත.

(i) කිරිමඩුව ශාන්තිකර්මයෙහි පූජාවිධි **හතරක්** නම් කර, ඉන් **එකක්** විස්තර කරන්න.

(ii) වලියක් මංගල්‍යය ශාන්තිකර්මයට ආවේණික විශේෂතා **තුනක්** පැහැදිලි කරන්න.

(iii) රටයකුම හෙවත් රිද්දි යාගයෙහි පෙළපාළි අංග **හතරක්** නම් කර උනුනු පියන භාවිත පෙළපාළි අංගයෙහි රංගභාණ්ඩ **දෙකක** උපයෝගීතාව විමසන්න.

5. ගැමි නැටුම් හා ගැමි නාටක මගින් සිංහල හා දෙමළ ජනතාවගේ සංස්කෘතික අනන්‍යතා ප්‍රකට කෙරේ.

(i) සටන් කලාව හා බැඳුණු සිංහල ගැමි නැටුමක් සහ ඊට සමාන ද්‍රවිඩ ගැමි නැටුමක් පිළිබඳ විස්තර කරන්න.

(ii) "දෙමළ ගැමි නර්තන, දේව භක්තිය ප්‍රකාශ කිරීම ප්‍රමුඛ කොටගෙන පවත්වනු ලැබේ." කාවඩි සහ කරගම් නර්තන ඇසුරෙන් විමසන්න.

(iii) මුදලි සහ ජස කෝලම් චරිත ඇසුරින් තත්කාලීන සිංහල ගැමි සමාජ පසුබිම පිළිබඳ විග්‍රහ කරන්න.

## III කොටස

6. පහත වගුවෙහි **(අ)**, **(ආ)** සහ **(ඉ)** යන කොටස් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| **(අ) කොටස** | **(ආ) කොටස** | **(ඉ) කොටස** |
|---|---|---|
| පඛාවාජ් | ශිව රංග | හංසවිල |
| කෝල් බෙරය | බැරිසිල් | මැක්බත් |
| මෘදංගය | නලදමයන්ති | නිදි කුමරිය |
| පුං බෙරය | පටාචාරා | නට් ක්‍රැකර් |

(i) **(අ)** කොටස - භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදායේ භාවිත තාල වාද්‍ය භාණ්ඩය තෝරාගෙන ඒ පිළිබඳ විස්තර කරන්න.

(ii) **(ආ)** කොටස - 2014 වර්ෂයේ නිෂ්පාදනය කළ දේශීය මුද්‍රා නාට්‍ය තෝරාගෙන එහි චරිත නිරූපණය පිළිබඳ විමසීමට ලක්කරන්න.

(iii) **(ඉ)** කොටස - 1890 වර්ෂයේදී ප්‍රථමවරට වේදිකාගත වූ බැලේ (Ballet) කෘතිය තෝරාගෙන එහි ප්‍රධාන කාන්තා චරිතය පිළිබඳ විමසන්න.

7. නර්තන කලාව සහ අනෙක් සෞන්දර්ය කලා අතර ඇති සහසම්බන්ධතාව නිර්මාණකරණයේ දී වැදගත් වේ.

(i) ප්‍රාසංගික නර්තන නිර්මාණ සඳහා සංගීතයෙන් ලැබෙන පිටිවහල පිළිබඳ සාකච්ඡා කරන්න.

(ii) නර්තන නිර්මාණකරණය සඳහා චිත්‍ර කලාවේ මූලිකාංග භාවිත කළ හැකි ආකාරය විමසුමට ලක් කරන්න.

(iii) බටහිර බැලේ සහ නෘත්‍ය නාටකවල සමවිෂමතා සංගීතය සහ ඇඳුම් පැළඳුම් යන අංග ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.

8. (i) රියැලිටි වේදිකාවේ ඉදිරිපත් කරන කණ්ඩායම් නර්තන මගින් දේශීය අනන්‍යතාව සුරකේ ද? විමසන්න.

(ii) විසිඑක්වන සියවසේ ශ්‍රී ලාංකේය නර්තන කලාව කෙරෙහි කාන්තා දායකත්වය කෙබඳු ද? ඔබේ අදහස් දක්වන්න.

(iii) නූතන නර්තන කලාව පිළිබඳ විමසීමේ දී, දේශීය සංස්කෘතික ලක්ෂණ අභිබවා බටහිර සංකල්පීය ලක්ෂණ ස්ථාපිත වීම කෙරෙහි ජනමාධ්‍ය බලපා ඇත. විචාරය කරන්න.

***

CS CamScanner

AL/2023(2024)/52/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 | S | II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
* **II** හා **III** කොටස්වලින් **අවම වශයෙන් එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

## I කොටස

1. (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරාගෙන සමගුණ සහ දෙගුණට ප්‍රස්තාර කරන්න.
   (අ) දොම්කිට කිට දොම් (ආ) රෙගුඳ ගතකු දොම් (ඉ) කිටිතක දොම්කිට
   
   (ii) පහත සඳහන් කවි පාදය අවග්‍රහයෙන් ආරම්භ කර මැදුම් තනිතිතට ප්‍රස්තාර කරන්න.
   "ධීර ගුණැති දීපංකර මුනි බුදු වෙමිනේ..."
   
   (iii) සුරපති වන්නමේ කස්තිරම හෝ ග්‍රහදණ්ඩ තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ මෙස වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

2. ශ්‍රී ලාංකේය නර්තන කලාව උදෙසා රාජ්‍ය අනුග්‍රහය ලැබී ඇති බව පුරාවිද්‍යා හා සාහිත්‍ය මූලාශ්‍රය මගින් හෙළි වේ.
   (i) දුටුගැමුණු රජතුමා ආගමික කටයුතු සඳහා නර්තනය සහ වාදනය සම්බන්ධ කරගත් බවට මහාවංශය සහ ථූපවංශය ඇසුරින් **එක්** සාධකය බැගින් ගෙන පැහැදිලි කරන්න.
   
   (ii) මහා පරාක්‍රමබාහු රජතුමා නාට්‍ය, ගීත ආදී විනෝදාංග සඳහා ද අනුග්‍රහය දක්වා ඇති බව මූලාශ්‍රය **දෙකක්** ඇසුරින් විස්තර කරන්න.
   
   (iii) සිංහල සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේ දී නර්තන කලාවට ද හිමිවූයේ ප්‍රමුඛස්ථානයකි. සාධක **හතරක්** ඇසුරින් සාකච්ඡා කරන්න.

## II කොටස

3. දේශීය ශාන්තිකර්ම මගින් සමාජ සහජීවනය සඳහා මෙන්ම මනෝ චිකිත්සනය සඳහා ද උපදේශන සපයයි.
   (i) බලි ශාන්තිකර්ම හා බැඳුණු සමාජ විශ්වාස **දෙකක්** පැහැදිලි කරන්න.
   
   (ii) ඌරා යක්කමෙන් සමාජ සහජීවනය සඳහා ලබාදෙන උපදේශන **දෙකක්** විමසුමට ලක් කරන්න.
   
   (iii) සන්නියකුම ශාන්තිකර්මයෙන් මනෝ චිකිත්සනය සිදුවන අයුරු සන්නි චරිතයක් සහ යක්ෂ චරිතයක් ඇසුරින් විග්‍රහ කරන්න.

[දෙවැනි පිටුව බලන්න

4. දේශීය ශාන්තිකර්ම විවිධ අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා යොදාගැනී ඇත.
   (i) කිරිමඩුව ශාන්තිකර්මයෙහි ප්‍රධාන **හතරක්** නම් කර, ඉන් **එකක්** විස්තර කරන්න.
   (ii) වලියක් මංගල්‍යය ශාන්තිකර්මයට ආවේණික විශේෂතා **තුනක්** පැහැදිලි කරන්න.
   (iii) රටයකුම හෙවත් රිදී යාගයෙහි පෙළපාළි අංග **හතරක්** නම් කර උඩරට පියන භාවිත පෙළපාළි අංගයෙහි රංගනාංග **දෙකක** උපයෝගීතාව විමසන්න.

5. ගැමි නැටුම හා ගැමි නාටක මගින් සිංහල හා දෙමළ ජනතාවගේ සංස්කෘතික අනන්‍යතා ප්‍රකට කෙරේ.
   (i) සටන් කලාව හා බැඳුණු සිංහල ගැමි නැටුමක් සහ ඊට සමාන ද්‍රවිඩ ගැමි නැටුමක් පිළිබඳ විස්තර කරන්න.
   (ii) "දෙමළ ගැමි නර්තන, දේව භක්තිය ප්‍රකාශ කිරීම ප්‍රමුඛ කොටගෙන පවත්වනු ලැබේ." කාවඩි සහ කරගම් නර්තන ඇසුරෙන් විමසන්න.
   (iii) මුදලි සහ ජස කෝලම් චරිත ඇසුරින් තත්කාලීන සිංහල ගැමි සමාජ පසුබිම පිළිබඳ විග්‍රහ කරන්න.

## III කොටස

6. පහත වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| පඛාවාජ් | ශිව රංග | හංසවිල |
| කෝල් බෙරය | බැරිසිල් | මැක්බත් |
| මාදංගය | නලදමයන්ති | නිදි කුමරිය |
| පුං බෙරය | පටාචාරා | නට් කැකර් |

   (i) (අ) කොටස - භරත නාට්‍යම් නර්තන සම්ප්‍රදායේ භාවිත තාල වාද්‍ය භාණ්ඩය තෝරාගෙන ඒ පිළිබඳ විස්තර කරන්න.
   (ii) (ආ) කොටස - 2014 වර්ෂයේ නිෂ්පාදනය කළ දේශීය මුද්‍රා නාට්‍ය තෝරාගෙන එහි චරිත නිරූපණය පිළිබඳ විමසීමට ලක්කරන්න.
   (iii) (ඉ) කොටස - 1890 වර්ෂයේදී ප්‍රථමවරට වේදිකාගත වූ බැලේ (Ballet) කෘතිය තෝරාගෙන එහි ප්‍රධාන කාන්තා චරිතය පිළිබඳ විමසන්න.

7. නර්තන කලාව සහ අනෙක් සෞන්දර්ය කලා අතර ඇති සහසම්බන්ධතාව නිර්මාණකරණයේ දී වැදගත් වේ.
   (i) ප්‍රාසංගික නර්තන නිර්මාණ සඳහා සංගීතයෙන් ලැබෙන පිටිවහල පිළිබඳ සාකච්ඡා කරන්න.
   (ii) නර්තන නිර්මාණකරණය සඳහා චිත්‍ර කලාවේ මූලිකාංග භාවිත කළ හැකි ආකාරය විමසුමට ලක් කරන්න.
   (iii) බටහිර බැලේ සහ නෘත්‍ය නාටකවල සමවිෂමතා සංගීතය සහ ඇඳුම් පැළඳුම් යන අංග ඇසුරෙන් ඇගයීමට ලක් කරන්න.

8. (i) රියැලිටි වේදිකාවේ ඉදිරිපත් කරන කණ්ඩායම් නර්තන මගින් දේශීය අනන්‍යතාව සුරැකේ ද? විමසන්න.
   (ii) විසිඑක්වන සියවසේ ශ්‍රී ලාංකේය නර්තන කලාව කෙරෙහි කාන්තා දායකත්වය කෙබඳු ද? ඔබේ අදහස් දක්වන්න.
   (iii) නූතන නර්තන කලාව පිළිබඳ විමසීමේ දී, දේශීය සංස්කෘතික ලක්ෂණ අභිබවා බටහිර සංකල්පීය ලක්ෂණ ස්ථාපිත වීම කෙරෙහි ජනමාධ්‍ය බලපා ඇත. විචාරය කරන්න.

***

PAST PAPERS WIKI

WWW.PastPapers.WIKI

Download past papers, notes, and more from Past Papers Wiki!